ආයතනයේ නම: දිස්ත්‍රික් ලේකම් කාර්යාල - රත්නපුර

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நிறுவனத்தின் பெயர்; மாவட்டச் செயலகக் காரியாலயம்- இரத்தினபுரி

பாராளுமன்ற அரசாங்க கணக்காய்வுக் குழுவினால் அட்டவணையிடப்பட்டுள்ள அறிக்கை தொடர்பாக நிலையான கட்டளை இல 119(4) ன் கீழ் கௌரவ அமைச்சரினால் எடுக்கப்பட்ட படிமுறைகள் பாராளுமன்றத்திற்கு முன்வைத்தல்.

**Name of the institution: District Secretariat Ratnapura**

**Submission of observations of Hon Minister and steps taken with regard to the Reports tabled by the Committee on Public Accounts in terms of Standing Order**

**No 119(4)**

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය : රත්නපුර

| රා.ගි.කා.සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මඟපෙන්වීම් | වර්තමාන ප්‍රගතිය |
|---|---|
| **පළමු කොටස:**<br><br>විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු සපයා නොතිබීම | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂය තුළ පිළිතුරු සැපයීමේ තරමක ප්‍රමාදයක් පැවතුණද, වර්තමානයේ බොහෝ විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු යොමු කිරීමට හැකි වී ඇත. |
| වාහනයක් ගර්හිත වී මාස 6ට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම. | ගර්හිත මට්ටමේ වාහන නොමැත. |
| සෑම වාහනයකම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි. | ලොග් පොත් මේ වන විට යාවත්කාලීන කර ඇත. |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂා කර නොතිබුණි. | එක් වාහනයක් අළුත්වැඩියා තත්ත්වයේ පවතින අතර එක් වාහනයක ඉන්ධන දහනය සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇත.අනෙකුත් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර ඇත. |
| බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි. | 2020 වර්ෂයට අදාළව ගැලපුම් කළ යුතුව තිබූ සියලු ශේෂ මේ වන විට නිරවුල් කර ඇත. |
| මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයයකට සළසා තිබූ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි ප්‍රතිපාදන සීමව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණි. | වර්ෂය තුළ ගිණුම් ගතවී ඇති සත්‍ය වියදම ප්‍රතිපාදන සීමාව ඉක්මවා නොමැති වුවද,<br>බැරකම් සමග සමහර විෂයයන් වල වියදම් ප්‍රතිපාදන සීමා ඉක්මවා ඇත. එම තත්ත්වයට හේතු වී ඇත්තේ සමහර බැරකම් නිශ්චිතවම හඳුනා ගැනීමට නොහැකි නිසා (ජල හා විදුලි) හා වර්ෂය තුළ වියදම් දැරුවද නිලධාරීන් නියමිත පරිදි අදාළ වර්ෂය තුළ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් බැරකම් ඇති වී ඇති ප්‍රමාණය ගණනය කිරීමට ඇති ගැටළුකාරී තත්ත්වයයි.මෙම නිසා මු.රෙ.66 හා 69 අනුව කටයුතු කර ප්‍රතිපාදන සළසා ගැනීමේ අවස්ථා ඇහිරී ඇත. කෙසේ වෙතත් මෙවැනි තත්ත්වයන් ඇති වීම වළක්වා ගැනීම සඳහා පියවර ගැනීමට උපදෙස් ලබා දී ඇත. |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | වැඩ තහනමට ලක්වූ නිලධාරීන්ගේ හිඟ ණය ශේෂයන්ගෙන් මේ වන විට,<br>- ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ තහනමට ලක් වූ කාර්යාල සේවක සේවයේ නියුතු ඒ.ඩී.එස්.දිසානායක මහතා යළි සේවයේ පිහිටුවා ඇත.<br>-අයගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් අයෙකු 7500 බැගින් වාරික 4 ගෙවා අවසන් කර ඇත.<br>ඉතිරි අයගෙන්ද අදාළ හිඟ ණය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ වන විට පොදු තැන්පතු ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කර ඇත.<br>- රාජ්‍ය ආදායමට බැර කර ඇත.<br>-බිල්පත් ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් සිදු කර ඇත.<br>- බිල්පත් ඉදිරිපත් නොවීම හා අක්මුදල් ප්‍රමාණවත් නොවීම වැනි හේතු නිසාවෙන් තවදුරටත් තැන්පතු ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු ලෙස ශේෂයන් පෙන්නුම් කරයි. |

| | |
|---|---|
| අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි. | සංවර්ධන නිලධාරීන්ගේ අතිරික්තයක් පවතින අතර, අමාත්‍යාංශය මගින් බඳවා ගැනීම් සිදුකර අනුයුක්ත කිරීම් සිදු කර ඇත. |
| <u>දෙවැනි කොටස:</u><br><br>ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.<br>හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක හඳුනා ගැනීම මැන බැලීම සඳහා කාර්ය සාධන ඉලක්ක නියම කර නොතිබුණි.<br>තිරසර අරමුණු ඉලක්ක ළඟා කර ගැනීමට අදාළ නිශ්චිත පාර්ශ්ව හඳුනාගෙන නොතිබීම. | 2020 වර්ෂයට අදාළව තිරසර අරමුණු හඳුනාගෙන ගොනුවක් පවත්වාගෙන කටයුතු කර ඇති අතර, 2023 වර්ෂයටද තිරසර අරමුණු හඳුනාගැනීමට සැලැස්මක් සකස් කර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |
| 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. | පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර ඇත. |
| පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නැතත්, ක්‍රියාත්මක වීම පිළිබඳව මාණ්ඩලික නිලධාරීන්ගේ අධීක්ෂණයට භාජනය වේ. |
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2020 හා 2021 වර්ෂයට මානව සම්පත් සැලැස්ම සකස් කර ඇත. |
| සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අතිරේක පුහුණුවක් නියම කර නොතිබුණි. | මානව සම්පත් සැලැස්ම අනුව පුහුණු කටයුතු කරයි. |
| සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | 2022 වර්ෂයට අදාළව ගිවිසුම්ගත වී ඇත. |
| මානව සම්පත්සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි. | පුහුණු සම්බන්ධයෙන් මාණ්ඩලික නිලධාරියෙකු පත් කර ඇත. |
| සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2020 වර්ෂය තුළ කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි පුහුණු අවස්ථා ලබා දීමට නොහැකිවිය. වර්තමානයේදී සැලසුම් කළ ඇති පරිදි පුහුණු අවස්ථා ලබා දීමට කටයුතු කරයි. |

| | |
|---|---|
| විගණකාධිපතිවරයා විසින් ඡේද වලින් පෙන්වා දී තිබූ අඩුපාඩු /දෝෂ නිවැරදි කරවාගෙන නොතිබුණි. | මෙතෙක් විසඳා නොමැති කරුණු ලෙස දක්වා තිබූ,<br>- දැක්ම හා මෙහෙවර සම්බන්ධයෙන් 2021.11.11 හා 12 දෙදින පැවැත්වූ දිසාපති සමුළුවේදී සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා පොදු දැක්මක් හා මෙහෙවරක් සකස් කිරීම අමාත්‍යාංශය විසින් පත් කරන ලද කමිටුවක් මගින් සිදු කරන බව දැනුම් දී ඇත.<br>-කුරුවිට ප්‍රාදේශීය ලේකම් ලේකම් නිල නිවාසය අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් සිදු කළ විනය පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ පරිදි කාර්මික නිලධාරි ටී.ටී.මනමේන්ද්‍ර මහත්මිය සියළු චෝදනා වලින් නිදොස් කොට නිදහස් කර ඇත.<br>-සංස්කෘතික මධ්‍යස්ථාන වල ප්‍රගතිය ඇමුණුම 1න් දක්වා ඇත. |
| ආයතනය විසින් ඉටුකළ යුතු ප්‍රමුඛතම සේවා 5ක් හඳුනාගෙන නොතිබුණි. | 2020 හා 2021 වර්ෂයට අදාළව ප්‍රමුඛතම සේවාවන් 5ක් හඳුනාගෙන ඇත. |
| හඳුනාගත් සේවාවන් සඳහා ඉලක්ක තීරණය කර නොතිබුණි. | ඉලක්ක තීරණය කර ඇත. |
| හඳුනාගත් සේවා ඉලක්ක සපුරා ගැනීම මැන බැලීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | තොරතුරු තාක්ෂණය යොදා ගෙන සේවා ඉටු කිරීමට, මැනීමට ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරමි. |
| හඳුනාගත් ඉලක්ක පිළිබඳ විස්තර 2019 ජනවාරි මස 15ට පෙර විගණකාධිපතිවරයාට පිටපත් සහිතව අමාත්‍යාංශය වෙත යොමු කර නොතිබුණි. | ඉදිරියේදී විධිමත් පරිදි හඳුනාගත් ඉලක්ක විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කරමි. |
| හඳුනාගත් කාර්ය දර්ශකයේ ළඟාවීම 24%ට වඩා අඩු ප්‍රමාණයෙන් විය. | 2021 වර්ෂයේ හඳුනාගත් කාර්ය දර්ශකයේ ළඟාවීම 86.76% |

.................................

දිස්ත්‍රික් ලේකම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

රත්නපුර

වසන්ත ගුණරත්න
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
රත්නපුර.

.................................

ප්‍රධාන අභ්‍යන්තර විගණක

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

රත්නපුර

ආර්. යූ. ඩී. ලාකෂිකා කරුණාරත්න
ප්‍රධාන අභ්‍යන්තර විගණක
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
රත්නපුර

- <u>ගොඩකවෙල සංස්කෘතික මධ්‍යස්ථානය</u> - මෙම සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල භාවිතය සඳහා යොදා ගෙන ඇත. එහෙත් ඉදිරියේදී මෙම මධ්‍යස්ථානය සඳහා ගබඩා කාමරයක් සහ වේදිකාවක් ඉදිකිරීමට අවශ්‍යව ඇති බව පෙන්වා දී ඇත.
- <u>ඉඹුල්පේ සංස්කෘතික මධ්‍යස්ථානය -</u> මෙම සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල භාවිතය සඳහා යොදා ගෙන ඇත. ඉදිරියේදී අළුත්වැඩියා හෝ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට නොමැත.
- <u>ඔපනායක සංස්කෘතික මධ්‍යස්ථානය -</u> මෙහි සංස්කෘතික මධ්‍යස්ථානය සාර්ථකව පවත්වාගෙන යයි. මෙම මධ්‍යස්ථානයෙහි ප්‍රධාන ගොඩනැගිල්ලෙහි වේදිකාව මේ වන විට දිරාපත් වී අබලන් ඇති අතර, එම අඩුපාඩු සැකසීම සඳහා මෙම ව්‍යාපෘතියට අදාළ රැඳවුම් මුදලින් රු.600,000 ක ප්‍රතිපාදන ලබාදී, එහි ඇස්තමේන්තු ඔපනායක කාර්මික නිලධාරි විසින් සකස් කරමින් පවතී.
- <u>වැලිගෙපොල සංස්කෘතික මධ්‍යස්ථානය</u> - මෙම සංස්කෘතික මධ්‍යස්ථානය භාවිතයට ගත හැකි මට්ටමට වැඩ අවසන් කර නොමැත. මෙම මධ්‍යස්ථානයෙහි ඉතිරි වැඩ නිම කිරීමේ කර්මාන්තයට අදාළව 2021.10.29 දින ලංසු විවෘත කිරීම සිදු කරන ලදී. නමුත් ඒ සඳහා කිසිදු කොන්ත්‍රාත්කරුවෙකු මිළ ගණන් ඉදිරිපත් කර නොමැති වූ බැවින්ද, නැවත මිළ ගණන් කැඳවා මෙම වර්ෂයේ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බැවින්ද, ප්‍රතිපාදන යළි පවරා ගෙන 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කර දෙන මෙන් බුද්ධශාසන අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇත. මෙම සංස්කෘතික මධ්‍යස්ථානයට අදාළව ඉතිරි වැඩ නිම කිරීමට අදාළව නව ඇස්තමේන්තුව බුද්ධශාසන අමාත්‍යාංශය වෙත යොමු කර ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලා 2022.02.11 දිනැතිව ලිපියක් යොමු කර ඇත.
- <u>කොලොන්න සංස්කෘතික මධ්‍යස්ථානය -</u> මෙම මධ්‍යස්ථානය භාවිතයට ගතහැකි මට්ටමට ඉදිකර නොමැත. අත්තිවාරම පමණක් නිමකර ඇත. ඉතිරි වැඩ සඳහා රු.22,662,047.79 ක ඇස්තමේන්තුවක් යොමු කර ඇත. අමාත්‍යාංශය විසින් අනුමත කර ලබාදී තිබූ රු.මි.10ක ප්‍රතිපාදන සඳහා ඉදිකිරීම් සිදු කර නොමැති බැවින්, එම ප්‍රතිපාදන නැවත අමාත්‍යාංශය වෙත පවරා ඇත.
- <u>කහවත්ත සංස්කෘතික මධ්‍යස්ථානය -</u> මෙම ගොඩනැගිල්ල භාවිතයට නොගන්නා අතර, භූමියේ අස්ථාවරත්වය හේතුවෙන් සේවා පියසක් ලෙස පවත්වාගෙන යාමට අනුමැතිය ලැබී ඇත. මෙතෙක් සේවා පියස ඉදිකිරීමට ප්‍රතිපාදන අනුමත වී නොමැත. එහෙත් සම්පූර්ණයෙන්ම නිම නොවූ, අළුත්වැඩියා කළ යුතුව පවතින මෙම ගොඩනැගිල්ල, ශ්‍රම දායකත්වය යටතේ පිළිසකර කිරීම් සිදු කර දැනට නිම කර ඇති කොටස සේවා පියසක් ලෙස භාවිතා කිරීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව සේවා පියසක් ලෙස භාවිතා කිරීමට හැකියාව පවතීද යන්න විමසා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත ලිපියක් යොමු කර ඇත.

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

නීල් බණ්ඩාර හපුහින්න
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
ස්වදේශ කටයුතු අංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග මගින් 2023 වර්ෂය තුල දි සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟාකර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)
අග්‍රාමාත්‍යතුමා සහ
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍ය.